# පුනරුද යුගයට අයත් ආගමික තේමා සහිත සිතුවම් සහ 'මැඩෝනා'

රයිගම් කෝරලගේ පියුමි මහේෂිකා[1]

මැඩෝනා සිතුවම් යන සංකල්පය පුනරුද යුගයට ලැබෙනුයේ මධ්‍යකාලීන යුගයෙනි. පුනරුද යුගයේ ඇති වූ බුද්ධි ප්‍රබෝධය හා චින්තන වෙනස සමඟ මේ තේමාව යටතේ ඇඳි සිතුවම් වඩාත් වර්ධනීය තත්ත්වයකට පත් විය. මධ්‍යකාලීන යුගයේ Icon සිතුවම්වලින්ලත් ආභාසය මුල් පුනරුද යුගයේ සිතුවම්වලට යම්තාක් දුරකට පාදක විය. උච්ච පුනරුද යුගය වන විට මේ තේමාව වඩාත් වර්ධනීය තත්ත්වයකට පත් විය. පුනරුද යුගයේ දී මානවවාදය ඉස්මතු වීමත් සමඟ උත්තරීතර සංකල්පයෙන් සිතීමට පෙලඹීම ඊට එක් හේතුවක් විය. මානව රූපය නිවැරදි ව නිරූපණය කිරීම සඳහා ශිල්පීන් නිරන්තරයෙන් මානව කාය ව්‍යවච්ඡේදය හා මානව ඉරියව් පිළිබඳ ව අගය කළහ. මෙහි ප්‍රතිඵලය වූයේ මැඩෝනා සිතුවම් අතිශය තාත්ත්වික ලක්ෂණවලින් යුතු ව ඉදිරිපත් කිරීමට ශිල්පීන් පෙලඹීම යි. ප්‍රකාශනාත්මක අංගචලන හා ඉරියව්, රේඛීය පර්යාවලෝකනය, වර්ණ පර්යාවලෝකනය, කියරස් කියුරෝ (Chiaros Curo) වැනි ශිල්ප ක්‍රම භාවිතය මූලික වශයෙන් දැකගත හැකි ය. සිතුවම්වල රූප පිහිටුවා ඇත්තේ ත්‍රිමාණ අදහාගත හැකි අවකාශයක වීම මේ යුගයේ විශේෂ ලක්ෂණයකි. ඔවුන්ගේ ඉරියව් හා අංගචලන සංකීර්ණ මෙන් ම විධිමත් සංරචනයක අන්තර්ගත කර ඇත. භාව ප්‍රකාශනයෙන් ද යුක්ත ය. මරියතුමියගේ කරුණාභරිත ස්වභාවයත් ජේසු බිළිඳාගේ මොළකැටි ස්වභාවයත් වෙන් වෙන් වශයෙන් පෙන්වමින් සියුම් විස්තරාංග ගෙන හැරපෑමට උච්ච පුනරුද යුගය වන විට ශිල්පීන් සමත් විය. වස්ත්‍ර දැක්වීම ද අතිශය තාත්ත්වික ය. සිත්ගන්නාසුලු ය. මේ සියලු ලක්ෂණයන්ට කදිම නිදසුන් ලෙස ඩාවින්සිගේ 'Madonna of the carnation, Madonna of the Pink' ආදි සිතුවම් දැක්විය හැකි ය. එමෙන් ම මෙතෙක් පැවති සම්ප්‍රදායයෙන් බැහැර ව එළිමහනේ දර්ශනතල පසුබිම සඳහා යොදාගැනීමට ශිල්පීන් උත්සුක වූ බව ඩාවින්සිගේ ගිරි අරණේ මරියතුමිය රෆායල්ගේ 'Madonna and child with St. John, Madonna Pasadena', ආදි සිතුවම් අධ්‍යයනයෙන් පෙනේ. මානවවාදය ඉස්මතු වීමත් සමඟ මානව රූපය නිවැරදි ව, සුන්දර ව දැක්වීමට ඔවුන් තුළ තිබූ උනන්දුව මෙන් ම උද්භිත විද්‍යා, භූගර්භ විද්‍යා ආදි අංශවලින් ඔවුන් ලැබූ බුද්ධිමය ප්‍රබෝධය මෙසේ වඩාත් තාත්ත්වික ලෙස හා එළිමහනේ දර්ශනතල සහිත ව අදහාගත හැකි අවකාශයක මැඩෝනා සිතුවම් නිර්මාණය වීමට හේතු විය. එමෙන් ම මැඩෝනා සිතුවම්වල ආකෘතිය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී මධ්‍යකාලීන යුගයේ බොහෝ විට සිංහාසනාරූඪ ව සිටින අයුරින් මරියතුමිය නිරූපිත නමුත් උච්ච පුනරුද යුගය වන විට වෙනස් ආකෘති යටතේ මැඩෝනා සිතුවම් නිර්මාණය විය. මධ්‍යකාලීන යුගයේ තේමාවක් වූ මරියතුමිය හා ජේසු බිළිඳාගේ සිතුවම් පුනරුද යුගයේ දී ක්‍රමයෙන් වර්ධනය වී උච්ච පුනරුද යුගය වන විට වෙනස් ම ආකෘති යටතේ වඩාත් තාත්ත්වික ශෛලියක් අනුව නිර්මාණය වූ බව පැහැදිලි ය.

**ප්‍රමුඛ පදඃ** මැඩෝනා සිතුවම්, මානව වාදය, මානව ඉරියව්, උච්ච පුනරුද යුගය

[1] දෘශ්‍ය කලා සැලැසුම්කරණය සහ ප්‍රාසගිංක කලා ඒකකය, ලලිත කලා අධ්‍යයනාංශය